PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

සභාපතිතුමා,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
05-11-2019

සභාපතිතුමනි,

**<u>දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොටසක් විවෘත කිරීම සම්බන්ධවයි</u>**

දක්ෂිණ අධිවේගී මාර්ගයේ මාතර සිට හම්බන්තොට දක්වා වූ මාර්ගයේ කොටසක් විවෘත කිරීමේ සූදානමක් පවතින බවත් එහිදී රැකියා ලබාදීමක් සිදුකෙරෙන බවටත් අප වෙත පැමිණිල්ලක් ලැබී ඇත.

සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙන්ම රැකියා උත්පාදනය සඳහාද අපගේ විරෝධයක් නොමැති වුවත් මැතිවරණයක් ආසන්නයේදී ඉදිවෙමින් පවතින මාර්ගයක කොටසක් විවෘත කිරීම දේශපාලනික වාසි ලබාගැනීම වෙනුවෙන් සිදුකරන්නේද යන්න පිළිබඳව පැහැදිලි සැකයක් මතුවේ.

එබැවින් මෙම විවෘත කිරීමේ උත්සව වලින් එක් දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය වේද යන්න පිළිබඳවත් රැකියා ලබාදීම දේශපාලනික අර්ථයෙන් සිදුවේද යන්න පිළිබඳවත් විමර්ශනය කර එසේ වන්නේ නම් එය වැළැක්වීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com